# නිවීගිය තාරකාව - ලිස්

සිනමා ලොව සහ සැබෑ ලොව යන දෙක්හි එකසේ පෙරළිකරමින් රංගන කෞෂල්‍යයේ ඉහළම තැන හිඳිමින් සමකාලීන සෙසු නිළියන් අතර ද අග්‍රස්ථානයක් හිමිකර ගනිමින් වැජඹුණු එළිසබෙත් ටේලර් හෙවත් ලිස් ටේලර් යනුවෙන් ප්‍රකටව සිටි සිනමා තාරකාව නොබෝදා නිවී ගියේය. උතුරු ලන්ඩනයේ හැම්ප්ස්ටඩ් ප්‍රදේශයේ 1932 පෙබරවාරි 27 වන දින උපත ලද එළිසබෙත් රොස්මන්ඩ් ටේලර්ගේ දෙමව්පියෝ ලන්ඩනයට පැමිණි ඇමරිකානුවෝ වූහ. මව ඇමරිකාවේ වේදිකා නිළියකව සිට විවාහ වූ පසු රඟපෑමෙන් ඉවත්වූ සාරා වයෝලා වෝම්බ්‍රෝට් ය පියා චිත්‍ර හා පින්තාරු වෙළෙන් දෙකු වූ ප්‍රැන්සිස් ලෙන් ටේලර්ය. එළිසබෙත්ට හොවාර්ඩ් නමින් වැඩිමහල් සොහොයුරෙකුද වීය.

සිනමා තිරයට නවතාවක් ද, නිළි වෘත්තියට ජවයද එක් කළ ඇය වැනි නිළියන් සමස්ත ලෝක සිනමාවේම විරලය. එළිසබෙත් නිසා සිනමාවද, සිනමාව නිසා එළිසබෙත් ද බැබළුණා යයි කිවහොත් නිවරදය. ඇය රඟපාන චිත්‍රපට බොක්ස් ඔපීස් වාර්තා සහ සම්මාන අතින් සාර්ථක වන බව නිශ්පාදකයෝ දැන සිටියහ.

2011 මාර්තු 22 වන දින ඇමරිකාවේ කැලිෆෝනියාවෙහිදී මිය යන විට ලිස් ටේලර් ඔස්කාර් සම්මානය දෙවරක් ද, වෙනත් විචාරක සම්මාන සිය ගණනක් ද දිනා සිටියා ය. හය වතාවක් ම ඔස්කාර් හොඳම නිළි සම්මානය සඳහා ඇගේ නම යෝජනා වී තිබුණි.

එළිසබෙත් රඟපෑම ඇරඹුයේ වයස අවුරුදු 8 දී 1940 දී හොලිවුඩ් හි නිපදවූ **There is one born every minute** හි ළමා චරිතයක් තුළිනි. ඉක්මනින් ලිස්ගේ ළමා මුහුණ හොලිවුඩ්හි ජනප්‍රිය වූයේ ය. ඒ නිසාම ළමා චරිත ඇය වෙත ඇදී එන්නට විය. Lassie come home 1943, Jane Eyre 1944, The White cliff of Dover 1944, National Velvet 1944, ඉන් කීපයකි.

එලිසබෙත් ටේලර් තරුණියක හැටියට රඟ පෑ ප්‍රථම චිත්‍රපටය 1950 දී තිරගත වූ Father of the Bride විය. එවිට ඇගේ වයස අවුරුදු 17 කි. එතැන් පටන් ඇය සිටි චිත්‍රපට රැසක් ලොව පුරා සිනමා ලෝලී රසිකයින් වසඟකර බැඳ තබන්නට සමත් වූයේය. රිචර්ඩ් බර්ටන් සමග ඇය රඟපෑ දවැන්ත හොලිවුඩ් නිශ්පාදනය ක්ලියෝපැට්රා අදත් කාටත් අමතක නොවන්නකි.

ඇය කිව යුතු දේ නොපැකිලව කියන කරන සෘජු ගැහැණියක ලෙස කවුරුත් හඳුනති. බල්ලන් බළලුන්ට ඇය දැක්වූ ආදරයද ඉමහත්ය. ඒඩ්ස් රෝග මර්දන ව්‍යාපාරයට දස දහස් ගණනින් මුදල් පරිත්‍යාග කළ ඇයට ඇමරිකාව ඇතුළු විවිධ යුරෝපීය රටවලින් සමාජසේවා සම්මානද, බ්‍රිතාන්‍ය මහ රැජිණ ගෙන් DBE හෙවත් Dame of British Empire ගෞරව නාමයද පිරිනමනු ලැබිණ.

ලිස් ටේලර් සිය ජීවිතයේ කොතෙක් පිරිමින් ඇසුරු කළාද යන්න දන්නේ ඇය පමණි. ප්‍රකට ජීවිතයේ පිරිමින් හත් අට දෙනෙකු සමීපව ඇසුරුකළා පමණක් නොව ඔවුන් හා විවාහද වූවාය. එහෙත් ඒවා කෙළවර වූයේ අඬදබර හා දික්කසාදවීම් ය.

ඇගේ විවාහ ජීවිතයේ විශේෂත්වයක් වන්නේ බ්‍රිතාන්‍යයේ සුප්‍රකට වේල්ස් ජාතික නළු රිචර්ඩ් බර්ටන් හා පෙමින් වෙළී ඔහු හා විවාහ වී, දික්කසාද වී, යළිත් විවාහවීමයි. ඇයකියන්නේ ඇයට වඩාත් සෙනෙහෙ පිදූ සැමියා බර්ටන් බවය. එනිසා ඇය රිචර්ඩ් බර්ටන් අධ්‍යාපනය ලැබූ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ නාට්‍ය ශාලාවට මුදල් පරිත්‍යාග කළාය. එම නාට්‍ය ශාලාවේ පුහුණු කිරීමේ ශාලාව නම්කර ඇත්තේ **Elizabeth - Burton Room** යනුවෙනි.

1957 දී තමාට වඩා අවුරුදු 23 කින් වැඩිමහල් ධනකුවේරයෙකු වන මයිකල් ටොඩ් සමගද, 1991 දී අවුරුදු 23 කින් බාල කම්කරුවෙකු වූ ලැරි ෆෝර්ටෙන්ස්කි හා විවාහවීමට තරම් පිරිමින් තෝරා ගැන්මේ ඇගේ මිණුම් දණ්ඩ සංකීර්ණ විය. තමාගේම දරුවන් තිදෙනෙක්ද, හදාගත් දරුවෙක්ද, මුනුබුරු මිනිබිරියන් 11 දෙනෙක්ද ඇයට වූහ. ඇයගේ වඩාත් ප්‍රකට මිත්‍රයා වූයේ ගායක මයිකල් ජැක්සන් ය.

එළිසබෙත් ටේලර් කොතෙකුත් පිරිමින් ඇසුරු කළද මියෙන විට අවිවාහකව සිටියාය. ඇගේ රංග කුසලතාවන් හා අයස්කාන්ත මුහුණුවර සිනමා අඹරේ බොහෝ කාලයක් දිලෙනු නොඅනුමාන ය.



**Elizabeth Taylor in 'Cleopatra'**

♦ **මේජර් වී. බී. කරුණාරත්න**
**Oxford UK**



# හොඳ හෝටලේකින් කෑම



**ශ්‍රීලංකාවේ හෝටලයක කුස්සියේ හැටිය මේ**

මෙයා හොඳ හෝටලේකින් තවම කාල නැහැ කියලා සමහර විට අපි තව කෙනෙකුට කියන වෙලාවල් තියනවා. සල්ලි තියන අය තමන්ගෙ රටට ගිහිල්ලත් හෝටල් වල නවතිනවා. මට නම් මගේ නෑයෙකුගෙ හරි යාළුවෙකුගෙ ගෙදර හරි ඉන්න එක සැපතක්, හෝටලේක නවතිනවට වඩා. ඒත් පිට රටකට ගියාම හෝටලේක නවාතැන් ගන්න වෙනවා. ඒත් මට තවම එහෙම වෙලා නැහැ. මම යුරෝපයේ හුඟක් රටවලටත් ඇමරිකාවට කැනඩාවටත් කීපවතාවක් ගිහිං තියනවා. මෑද පෙරදිගට, සිංගප්පූරුවට, මැලේසියාවටත් ගියා. ඒත් ඒ කිසිම රටකදි අපට එකද හෝටලේකවත් ඉන්න සිද්ධ වුණේ නැහැ. ඒ හැම තැනක දිම යාළුවෙක් ඇවිත් අපිව එක්ක යනවා. මැලේසියාවෙ සති දෙකක්ම හිටියෙ වොං චියැන් කියන චීන යාළුවෙකුගෙ ගෙදර. ඒ සත්කාර ලැබීම පෙර පිනක් වෙන්න ඇති.

මේ කියන්නෙ ළඟදි ලංකාවෙ මම දන්න පවුලක උදවියට වුණු මහා ව්‍යසනයක්. ඒ නම් ගම්, දින, බිල්පත් ඒ සේරම එක්කයි මේ විස්තරේ එවලා තියෙන්නෙ.

2011 ජනවාරි මාසෙ ලංකාවෙ මහනුවර ඉහළ පෙළේ පවුලක විවාහ මංගලෝත්සවයක් මහනුවර නගරයෙම ප්‍රසිද්ධ සුපිරි හෝටලයක පැවැත්වුණා. විශාල වියදමක් ගියා. මංගල සාද වලට හෝටල්වලට යන වියදම කියන්න අවශ්‍ය නැහැනේ, කවුරුත් දන්නවා. මංගල්‍යයට ආ ඒ නෑ හිතවතුන් අතර වැඩිපුරම හිටියෙ දොස්තරවරු, ඉන්ජිනේරුවො, නීතිඥවරු, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු, බැංකු කළමනාකාරවරු, හමුදාවෙ ඉහළ නිලධාරීන් සහ ව්‍යාපාරිකයින් විශාල පිරිසක්.

මංගල්‍ය උත්සවය අවසන්වෙලා, හෝටලේ භෝජන සංග්‍රහය අවසන් වෙනවාත් එක්ක තමයි තේරුණේ මනාල යුවල ඇතුළු එතන හිටි හැමෝටම, අර දොස්තරවරු, ඉන්ජිනේරුවො, ඇතුළු ඔක්කෝටම වමනෙ සහ බඩඑළිය යන්න පටන් ගත්තා. ඉක්මනට නුවර සහ මාතලේ ඉස්පිරිතාලවලට ඒ ලෙඩුන් ටික අරන් ගියා. හනිමූන් යාම පැත්තක තියලා මනාල ජෝඩුවත් රෝහලකට ඇතුල් කළා. වෛද්‍ය පරීක්ෂණ වලින් කිව්වෙ ඒ කාටත් දරුණු විදියට කෑම විසවීමක් වෙලා කියලා. ඒ සමහර ලෙඩුන්ට දින ගණනක් වාට්ටුවෙ ඉන්න වුණා.

ඒ හෝටලේ බුක්කරපු අය වහාම හෝටලේ පාලකයින්ට දැනුම් දුන්නා. මැනේජර් ඇතුළු කිසිකෙනෙක් මොකක්ද වෙලා තියෙන්නෙ කියලා සොයලා බලන්නෙවත් නැතුව පෙන්නුවෙ ඒක ඒ අයගෙ කෑම නිසා වෙච්ච වැරැද්දක් නෙවෙයි කියලා. හෝටලේ සේවකයො ඇතුළු සේරම අය හිටියෙ ගොළුවො වගේ.

සති කීපයක්ම මංගල්‍ය පිරිසෙ අය හෝටලේ මැනේජර්ට කතා කරන්න මහන්සි ගත්තත් මැන් ටෙලිපෝන් එකට ආවෙ නැහැ. හම්බවෙන්න හෝටලේට ගියාමත් වැඩක් වුණේ නැහැ. පස්සෙ නීතියෙන් කටයුතු කරනවයි කියලා ලියුමක් යැව්වම තමයි හෝටලේ පරිපාලන අංශයෙන් කියලා තියෙන්නෙ ඒ මංගල සාදයට ගිය වියදම ආපහු ගෙවන්න හෝටලේ ලෑස්තිය කියලා.

එහෙම කියලා තව මාසෙකට පස්සෙ ආයිත් ඇහුවම කවදද ඒ මුදල් ආපහු ගෙවන්නෙ කියලා ඒ මැනේජර් ඒ පාර කිව්වලු "අපි සතයක්වත් ගෙවන්නෙ නෑ.... තමුසෙලා පුළුවන් දෙයක් කරනවා...." කියලා. ඔන්න ශ්‍රී ලංකාවෙ හෝටල් වල හැටි.

ඉන්ජිනේරුවො දොස්තරවරු වගේ අයටත් ලංකාවෙ හෝටල්කාරයො එහෙම කතාකරනවා නම් උන් රටේ සාමාන්‍ය මිනිස්සුන්ට සංචාරකයින්ට කොහොම කතා නොකරාවිද?

සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න කතාකරනවා. පැරඩයිස් අයිලන්ඩ් කියලා කියනවා. ආගන්තුක සත්කාරයට මේ වගේ රටක් මුළු ලෝකෙම නැත කියනවා. ආයුබෝවන් කියලා වැඳගෙන ඉන්න කාන්තා පින්තූර කටවුට් කටුනායක ඉඳලා පාර දිගට තියනවා. කුරුම්බ ගෙඩියටත් රෝසමලක් ගහලා බන්දේසියක තියලා අල්ලන් ඉන්න පින්තූර හැම තැනම. අලි නුවර පාරෙ ටුවරිස්ට්ලගෙ අතින් කෙහෙල්ගඩ් කන විඩියෝ හදලා යූ ටියුබ් එකේ පෙන්නනවා. මේ සේරම අලි බොරු වැඩ. ඔය මොනව කෙරුවත් මොකටද ලංකාවෙ ඇත්ත හැසිරීම ඒක නෙවෙයි නම්. කොච්චරකල් ඔය විදියට ලෝකෙ රවට්ටන්නද? අර වගේ හෝටල්වලට යන ටුවරිස්ට්ලා ආයි ජීවිතේ කිසිදාක ලංකාව පැත්ත පළාතටවත් ගෙන්න ගන්න පුළුවන්ද?

♦ **වෙලේගෙදර රාළ London**


# ඇත්ත කෙටි කතාව — දොඩම් යුෂ ඇඟට ගුණද?

දොඩම් යුෂ හෙවත් කවුරුත් දැන් කියන ආකාරයට ඔරේන්ජ් ජූස් ඇත්තටම ශරීරයට ගුණදායකද නැද්ද කියන එක ගැන විවිධ මත තියනවා. මගේ මතය නම් ඔරේන්ජ් ජූස් ශරීරයට නොසෑහෙන්න අගුණයි. ඒක මම අත්දැකීමෙන්ම හොයා ගත්තු දෙයක්. ඒක වුණේ මෙහෙමයි.

ගිය සැරේ මං කිව්වෙ එක රෙස්ටුරන්ට් එකක වැඩට ගිහිං වෙච්ච දේ. මේ මම ඊළඟට වැඩකරපු තැන.

මේ ඉන්දියන් හෝටලේ කරන්නෙ අම්මයි පුතාල දෙන්නයි එකතුවෙලා. ඒ එක පුතෙක් නීතිඥයෙක් වෙන්න ඉගෙන ගන්නවා. ඉතින් අපේ විස්තර අහලා හොඳින් කතාකළා. පුතාලා ටයිපටි දාගෙන හින්දා මමත් හිතුවා වැඩට එනකොට ටයි එකක් දාගෙන එන්න. මට කිව්වා හෙට ඉඳලා වැඩට එන්නෙයි කියලා.

ඉතින් පස්සෙන්දා හොඳ මැදපු කමීසයක් ඇඳලා, ලංකාවෙන් එනකොට දාගෙන ආපු ටයි පටියත් බැඳගෙන හෝටලේ වැඩට ගියා. ගිහිල්ලා ටික වෙලාවකින් එක පුතෙක් මට අඬගහලා කුස්සියට එක්කගෙන ගියා. එතන තිබුණා ඉඳුල් පිඟන් ගොඩක් ගොඩගහලා දාලා සින්ක් එකක්. ඒක වතුරෙන් පුරවලා, හෝදන දියරත් දාලා තිබුණා, පෙණත් එක්ක. පුතා ඒ එක පිඟානක් හෝදල මට පෙන්නුවා. ස්පොන්ජ් කෑල්ලකින් යන්තම් පිහලා, පෙණ වතුරෙ දාලා ගන්නවා. ඒපාර ඒ පිඟාන රැක් එකක දානව වතුර බේරෙන්න. මට මතක් වුණා, අපි ලංකාවෙදි පොල්ලෙල්ලට සන්ලයිට් හරි, බාර්සෝප් හරි ගාලා දැලි තෙල් කුණු යන්න පිඟන් කෝප්ප, හට්ටි වළං අතුල්ලලා හෝදපු හැටි. ඉතිං මිනිහා මට වැඩේ බාර දීලා හෙමිහිට ඉස්සරහ පැත්තට ගියා.




මම හවස 6 ඉඳලා රෑ 12 වෙන කල් එක දිගට පිඟන් හේදුවා. ඒ වැඩේ පටන් අරන් ටිකක් වෙලාවක් යනකොට තමයි දැක්කෙ මගේ ටයි එක සින්ක් එකට වැටිලා අර වතුරෙ පෙඟිලා බව. ඒක ආයි දාං ඉන්න බෑ. ගලවලා පැත්තකින් තියල, පැයට පවුම් දෙකක් හම්බවෙනව නේ කියලා හිත හිත පිඟන් ටික සේරම හේදුවා. රෑ දොළහට කිට්ටු වෙද්දි හෝටලේ අයිතිකාර ගෑණු කෙනා තේ එකක් ගෙනැල්ලා දුන්නා, කට හරියට ගන්න බැරි.

කොහොම හරි රෑ දොළහට එළියට බහිනකොට කොන්ද හොල්ලන්න බැහැ. අඩිය හරියට තියන්නත් බැහැ. කකුල රුවිතෙට යන්නෙ. අමාරුවෙන් ගෙදර ගිහිල්ලා පහුවෙනිදා හවස දෙක තුන වෙනකල් නිදාගෙන, නැගිටලා, ඇඳ පැළඳගෙන ආයිත් අර ටයි එක දාගෙන, (එතකොට ඒක වේලිලා) හැන්දෑවෙ ගියා පිඟන් හෝදන්න. අපරාදෙ කියන්න බෑ, ඒ පුහුණුව නිසා තමයි අදත් මම ගෙදර හොඳට වළං පිඟන් හෝදන්නෙ.

වැඩකරන වෙලාවට කන්න බොන්න ලැබෙන්නෙ නැති හන්දා හරි අමාරුවෙන් හිටියෙ. දවසක් මට හොඳටම බඩගිනි වෙලා අයිතිකාරි ඉස්සරහ නැති වෙලාවක් බලලා බීම ජාති තියෙන බාර් එකේ ඇතුළට වැදිලා, දෙකට නැමිලා, විසාල ඔරේන්ජ් ජූස් පැකට් එකක් කඩලා කට තියලා බීගෙන බීගෙන ගියා. ඇත්තට ඒක පැකට් එකක් නෙවෙයි පෙට්ටියක් කිව්වොත් තමයි හරි. එච්චරට විසාලයි. එක පාරටම මගේ පපුව හිරවෙලා හුස්ම ගන්න බැරුව මං දඩස්ගාලා බිම ඇදගෙන වැටුණා. ඒ සද්දෙට වැඩ කර කර හිටපු ඔක්කොම අය එතනට දුවගෙන ආවා. මම ඔරේන්ජ් කාට්න් එක එක අතක තියාගෙන වැටිලා ඉන්නවා, හුස්ම ගන්න බැරුව. ඔරේන් ජූස් වල ගෑස් නිසා හුස්ම හිරවෙලා. දෙන්නෙක් මාව උස්සලා ගත්තා. තව කවුද පිටට ගහගෙන ගහගෙන ගියා, බීම ටික බඩට බහින කල්. ඊට පස්සෙ තමයි හුස්ම ගන්න පුළුවන් වුණේ. කොහොම හරි හොරෙන් ජූස් බීපු එක කවුරුත් දැනගත්තා. කවුරුවත් මුකුත් කිව්වෙ නැහැ. අයිතිකාරිත් හිනාවෙලා යන්න ගියා. මට මාර පල් එක.

ඉතින් ජූස් හොරෙන් බොන එක ගැන මට උදෙසක් දෙන්න පුළුවන්. දෙකට නැමිලා හැංගිලා ගුඩු ගුඩු ගාලා කවදාවත් ජූස් නෙවෙයි කිසිම බීමක් බොන්න යන්න එපා. ෂුවර් එකට අතේ කෝට්.

**නීතිඥ**
**අනුර හෑගොඩ**